සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2011 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,824 - 2013 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2013.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 734 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 736 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

### ඉඩම් හා ඉඩම් සංවර්වන අමාත්‍යාංශය

2002 අංක 17 දරන මැනුම් පනත

**27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම**

2002 අංක 17 දරන මැනුම් පනතේ 27(අ) වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කරමින් 2009.09.13 වැනි දින හා 2012.01.20 වැනි දිනැති *ගැසට් පත්‍රවල* පළකරන ලද නිවේදන පහත සඳහන් ලෙස 2013.07.25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරමි.

(අ) නිල බලයෙන් සාමාජිකයින් වන තැනැත්තන්-

(i) කනගරත්නම් තවලිංගම් මයා - සභාපති
සර්වේයර් ජනරාල්

(ii) කොහොන වලව්වේ නිමල් ධර්මකීර්ති කරුණාරත්න මයා - උප සභාපති
අතිරේක සර්වේයර් ජනරාල්

(iii) සිරි දියුපති පද්මනාභ ජයරත්න දාම්පෙගම මයා - සාමාජික
අධ්‍යක්ෂ, මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනය

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08- 578

---

### වන්දනා ගමන් ආඥාපනත

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ රොටුඹ පෙත්මග පුරාණ රජමහා විහාරයේ 2013 වාර්ෂික ආගමික උත්සවය 2013 සැප්තැම්බර් මස 09 සඳුදා දින සිට 2013 සැප්තැම්බර් මස 15 වැනි ඉරිදා දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනතේ 175 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනතේ 02 වැනි වගන්තිය අනුව 2009.09.18 වැනි දින නිකුත් කරන ලද අංක 1620 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* යටතේ මෙයින් දන්වමි.

කේ. එන්. කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
පස්ගොඩ.

2013 ජූලි මස 31 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08- 646

---

### 2013 යල කන්නය

මහඑළිය ව්‍යාපාරයේ කන්න රැස්වීම් වාර්තාව

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහඑළිය ව්‍යාපාරයේ 2013 යල කන්නය සඳහා කන්න රැස්වීම 2013.07.15 වැනි දින පිටපොල, ප්‍රජා ශාලාවේ දී පවත්වන ලදී. එහි දී පහත තීරණ ගන්නා ලදී.

1. වගා කරන බිම් ප්‍රමාණය - අක්කර 540
2. වගා කරන බෝගය - අර්තාපල්/මිශ්‍ර එළවළු
3. ඇල වේලි ශුද්ධ කර අවසන් කරන දිනය - 2013.07.20 දිනට පෙර
4. පළමු ජල මුරය නිකුත් කරන දිනය - 2013.07.04
5. බිම් සකසා සී සෑම අවසන් දිනය - 2013.07.19
6. බෝග පැළ සිටුවා අවසන් කරන දිනය - 2013.08.15
7. අවසන් ජල මුරය නිකුත් කිරීම - 2013.09.25
8. ඇලවේලි ශුද්ධ නොකිරීමේ දඩ මුදල - දිනක වැටුප (රු. 750)
9. දෙවන වර ඇල වේලි ශුද්ධ කිරීම - 2013.08.15
10. අස්වනු නෙලා අවසන් කරන දිනය - 2013.10.15
11. අවශ්‍යතාවය අනුව ජල හිඟයක් ඇති වූ විට මුර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය විය.
12. නියමිත දිනට ඇල වේලි ශුද්ධ නොකරන ගොවීන් සඳහා දඩ මුදල් අය කිරීම වාරිමාර්ග ආඥාපනත හා ගොවිජන සේවා පනත අනුව කටයුතු කිරීම.
13. වගා කරන යාය මට්ටමින් ගොවි කණ්ඩායම් පත්කර ගැනීම සුදුසු බවට යෝජනා වූ බැවින්, එසේ පත්කර ගන්නා ගොවි කණ්ඩායම් හා එහි නායකයින් පිළිබඳ විස්තර 2013.08.01 දිනට ප්‍රථම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබීමට කටයුතු කිරීම සුදුසු බවට තීරණය විය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2013 ජූලි මස 25 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08- 566

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/14/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2013.08.16 වැනි දින සිට 2013.08.30 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2013.09.06 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| මාතර දිස්ත්‍රික්කයේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ දරන කොට්ඨාසයේ 400 වෙළුමේ 279 පත්‍රිරුව. | දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර පත්තුවේ, මාතර නගර සභා සීමාව තුළ නූපේ පිහිටි අකුරැස්ස පාරේ, වරිපනම් අංක 15 දරන "කිරිමඩුවහේන හෙවත් කිරිමඩුවාකනත්ත බෙදූ ඊ, එෆ් සහ ජී දරන ඒකාබද්ධ ඉඩමෙන් බෙදූ අංක 01" නමැති ඉඩමේ අංක 01ඒ දරන කැබැල්ලට අයිවන් පී. ගාල්ලගේ මානකතැන විසින් 2000.02.09 වැනි දින මැන සාදන ලද අංක 1176 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br>*උතුරට* : පාලු වත්ත<br>*නැගෙනහිරට* : මාතර-අකුරැස්ස මහ පාර<br>*දකුණ* : ඉහත කී ප්ලෑන ප්‍රකාර බෙදූ 1බී කැබැල්ල<br>*බස්නාහිර* : මෙම ඉඩමේ අංක 02 කැබැල්ල<br>*ප්‍රමාණය* : අ. 00, රූ. 00, පර්. 06.44 | 01. ජේ. ජේ. කරුණාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2000.03.08 දින අංක 1698 දරන තෑගිකරය. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 434/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08-629

---

**වන්දනා ගමන් ආඥාපනත (175) වැනි අධිකාරිය**

ගැටබරු රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ උත්සවය - 2013

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික ගැටබරුව රජමහා විහාරස්ථානයේ ඇසල උත්සවය 2013 සැප්තැම්බර් මස 15 වැනි දින සිට සැප්තැම්බර් මස 21 වැනි දින දක්වා පවත්වනු ලබන බව (175 අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥාපනත යටතේ 1988

මාර්තු මස 31 වැනි දින නිකුත් කරන ලද අංක 500 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටස I ඡේදය (සාමාන්‍ය) ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි යටතේ මෙයින් දන්වමි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2013 ජූලි මස 29 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08- 632

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/පො/17.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 සහ 33 වැනි වගන්තිය යටතේ සාදන ලද අ980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03(06)(අ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, දම්මින්ද, කන්දේගම ධනංජය රජමහා විහාරස්ථානයේ පිහිටි පො/සාගරමති මූලික පිරිවෙන 2012.05.02 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරි ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය මාවනැල්ලේ සිරසාලංකාර ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03(06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2013 ජූලි මස 24 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

08- 477

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.06.09 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩී. මල්ලවාරච්චි විසින් සහතික කරන ලද 2007.11.07 දිනැති අංක 333 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, නම්බුකාර වසම් මුණසිංහගේ අනිල් යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හයලක්ෂ අනූදහස් අටසිය තිස් දෙකයි ශත අසූඅට (රු. 6,90,832.88) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.05.09 වැනි දින සිට වර්ෂයකට 23% බැගින් රුපියල් හයල්කෂ අනූදහස් අටසිය තිස් දෙකයි ශත අසූ අට (රු. 6,90,832.88) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්ත ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හයලක්ෂ අනූ දහස් අටසිය තිස් දෙකයි ශත අසූ අට (රු. 6,90,832.88) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාවිස් පුග්ගලික සමාගම විසින් එකී අංක 333 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, බෙරළන්න සහ අරුප්පස්ස ගම්වලට අයත්ව පිහිටි අලිවලපල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සී. එල්. පී. අතුකෝරල මහතාගේ 2007.07.22 දින පිඹුරු අංක 3171 පරිදි කැබලි අංක 34 සඳහා මායිම්, උතුරට : අංක 350/2006 දරන පිඹුරේ සඳහන් අංක 79 දරන ඉඩම් කොටස. නැගෙනහිරට : අංක 350/2006 දරන පිඹුරේ සඳහන් අංක 35 දරන ඉඩම් කොටස, දකුණට : අංක 350/2006 දරන පිඹුරේ සඳහන් අංක 50 දරන ඉඩම් කොටස, බස්නාහිරට : අංක 305/2006 දරන පිඹුරේ සඳහන් අංක 33 දරන ඉඩම් කොටස යන මායිම් තුළ පිහිටි පර්චස් පහලොව

(අ. 0, රූ. 0, පර්. 15)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ්323/33 හි ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කළ කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08- 584

---

පීවී 64424.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "පැක් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2008.06.12 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "පැක් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "පැක් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-458

---

පීවී 12885.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඇඩැම්ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 1989.12.20 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඇඩැම්ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඇඩැම්ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-516

---

පීවී 83642.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "හික්කා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.01.11 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "හික්කා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "හික්කා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-517

පීවී 82528.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ටොප් වර්ල්ඩ් මාර්කට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.11.16 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ටොප් වර්ල්ඩ් මාර්කට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ටොප් වර්ල්ඩ් මාර්කට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-514

---

පීවී 13123.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "සෙන්චරි ඩිස්ට්‍රිබියුෂන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 1993.07.29 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සෙන්චරි ඩිස්ට්‍රිබියුෂන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සෙන්චරි ඩිස්ට්‍රිබියුෂන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-459

පීවී 86114.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "රිටෝ ඉන්ටර්නැෂනල් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.05.23 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "රිටෝ ඉන්ටර්නැෂනල් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "රිටෝ ඉන්ටර්නැෂනල් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-460

---

පීවී 64957.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ද ජී ඇන්ඩ් එස් හොරයිසන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2008.07.25 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ද ජී ඇන්ඩ් එස් හොරයිසන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ද ජී ඇන්ඩ් එස් හොරයිසන් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-461

ජීජ් 2694.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "පෝලෝනියා ඒස්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.04.27 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "පෝලෝනියා ඒස් " ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "පෝලෝනියා ඒස් " නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජූලි මස 19 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-515

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.